


# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

## මධ්‍යම පළාත



# කාර්යය සාධන වාර්තාව 2012

"ගෙවන බද්ද මැද රටේ සංවර්ධනයටයි"

**පෙරවදන**

**01 ආයතනයේ නීතිමය තත්ත්වය**

පළාත් සභා පරිපාලන ඒකකය ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනය යටතේ පිහිටු වන ලදි. පළාත් සභාව තුළ ආදායම් ඉපයීමේ කටයුතු හැසිරවීම සඳහා පළාත් ආදායම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි.

මධ්‍යම පළාතේ ආදායම් දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත් සභාව විසින් සම්මත කර ගන්නා ලද 1990 අංක 17 දරන මුදල් ප්‍රඥප්තියේ නෛතික රාමුව තුළ පිහිටුවන ලදි.

ඉහත සඳහන් ප්‍රඥප්තිය යටතේ සහ 1996 අංක 3 දරණ සංශෝධිත ප්‍රඥප්තිය අනුව මධ්‍යම පළාත් ආදායම් කොමසාරිස් මගින් ඍජුව හෝ වක්‍රව පරිපාලනය වන ආදායම් ප්‍රභවයන් 13 ක් දක්වා ඇත. මෙම ආදායම් ප්‍රභවයන් 13 අතුරින් පහත සඳහන් ප්‍රභවයන් වර්තමානයේ දී ඍජුවම පළාත් ආදායම් දෙපාර්තමේන්තුව මගින් පරිපාලනය වේ.

1.මුද්දර ගාස්තු

2. ව්‍යාපාර පිරිවැටුම් බද්ද

3. ඔට්ටු බද්ද

**02. කාර්යයන් හා වගකීම්**

කාර්යක්ෂම සාමානාත්මක හා යුක්ති සහගත බදු පරිපාලන ක්‍රමයක් ස්ථාපිත කර මධයම පළාතේ ජනතා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය මූල්‍යමය සම්පත් නියමිත ඉලක්ක අභිබවමින් නීතියට එකගව බදු හා ගාස්තු වශයෙන් රැස් කිරීම හා ඊට අදාළව විධිමත් ප්‍රතිපත්තියක් කාලීන අවශ්‍යතා මත කාර්යක්ෂමව පවත්වා ගෙන යාම

**03. තත්ත්ව විශ්ලේෂණය**

2010 වර්ෂය අවසාන වන තෙක් දෙපාර්තමේන්තුවේ ප්‍රධානතම ආදායම් ප්‍රභවය වූයේ ව්‍යාපාර පිරිවැටුම් බද්දයි. මධ්‍යම රජයේ ප්‍රතිපත්තිමය තීරණයක් ලෙස මෙම බද්ද 2011 අයවැය යෝජනා මගින් අත්හිටුවන ලදි. එබැවින් වර්තමානයේ දී දෙපාර්තමේන්තුව මගින් ව්‍යාපාර පිරිවැටුප් බද්ද ලෙස අය කර ගනු ලබන්නේ 2010-12-31 දින දක්වා වූ හිග හිටි බදු පමණි.

පිරිවැටුම් බද්ද අහෝසිවීමත් සමගම අප දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආදායම් ප්‍රභවය බවට පත්වන්නේ මුද්දර ගාස්තුය. ඊට අමතරව ඔට්ටු බද්ද අයකිරීම සිදුවේ. මුද්දර ගාස්තු හැරුණු විට අනෙකුත් ප්‍රභවයන්ගේ ආදායම් මට්ටම පහළ අගයක් ගනී.

දෙපාර්තමේන්තුවේ තුන්වන පරමාර්ථය වන වාර්ෂික ආදායම් වර්ධන වේගය10%කට වැඩියෙන් පවත්වාගෙන යාමට නම් අනිවාර්යයෙන්ම 2012 වර්ෂය අවසන් වන විට නව ආදායම් ප්‍රභවයන් නිශ්චිත වශයෙන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීමට සූදානම් මට්ටමක පත්ව තිබිය යුතු විය. ඊට හේතු වන්නේ 2013 වන විට හිග පිරිවැටුම් බදු වල දායකත්වය අඩුවන බැවිනි. නමුත් මේ දක්වා යෝජනා සඳහා අනුමැතිය ලැබී නොමැත.

මෙවැනි පසුබිමක් තුළ පවතින ආදායම් ප්‍රභවයන්ගේ ආදායම් ලබාගැනීමේ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම හා ඵලදායි මට්ටමකින් පවත්වා ගැනීමත් නව ආදායම් ප්‍රභවයන් සොයා ගැනීමත් දෙපාර්තමේන්තුවට විශාල අභියෝගයක්ව පවතී. සමස්ථ බදු ක්‍රමයේ සිදුකළ වෙනස සහ මධ්‍යම පළාත් සභාව ලෙස 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ උපායශීලි සැළසුමටද පිටුවහලක් වන ලෙස පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ දැක්මේ සිට උපායයන් දක්වා සියළුම අංශයන් පැහැදිලි වෙනසකට භාජනය විය.

# පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

# මධ්‍යම පළාත

**දැක්ම**

මධ්‍යම පළාතේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක්

**මෙහෙවර**

ව්‍යවස්ථාපිත ආදායම් මූලාශ්‍ර තුළින් ආදායම් රැස්කිරීමත්, බදු හා ගාස්තු ගෙවිය යුතු පුද්ගලයන් සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමත්, ඒ සම්බන්ධයෙන් විනිවිදභාවයෙන්, සමානාත්මතාවයෙන් හා සාධාරණව කටයුතු කිරීමෙන්, මධ්‍යම පළාතේ ආදායම වැඩි දියුණු කිරීම මගින් පළාත්වාසීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.

**වටිනාකම** :

1. පරිපූර්ණත්වය
2. වෘත්තීය දක්ෂකම
3. කැපවීම
4. සහයෝගීත්වය

**2012 වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අරමුණු**

1. 2012 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල මිලියන 725 ක්එකතු කිරීම.
2. පවතින හිග පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 60 ක් 2012 දී එකතු කිරීම.
3. සියයට දහයට (10 % ) වැඩි වාර්ෂික ආදායම් වර්ධන අනුපාතයක් පවත්වාගෙන යාම.
4. පළාත් පාලන ආයතනවල ආදායම් වැඩි කිරීමට සහය වීම

**ආදායම් ඉලක්කය 2012 වර්ෂය**

| ආදායම් ප්‍රභවය | | ඉලක්කය රුපියල් |
|---|---|---|
| 01 | මුද්දර ගාස්තු | 725,000,000 |
| 02 | හිග පිරිවැටුම් බදු | 60,000,000 |
| 03 | ඔට්ටු බද්ද | 300,000 |
| | එකතුව | 785,300,000 |

## 2012 වර්ෂයේදී අරමුණු කරා ළඟාවීමේ ප්‍රගතිය

### 1. 2012 වර්ෂයේදී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල මිලියන 725 ක් එකතු කිරීම.

ඉහත අරමුණ වෙත ලගා වීමට දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මුල සිටම මනා සැලැස්මක් ඇතිව කටයුතු කල අතර දෙපාර්තමේන්තුවේ වැඩ බෙදාහැරීමේදී මුද්දර අංශය වෙත වැඩි අවධානයක් යොමු කරන ලදි. ඒ අනුව ජ්‍යෙෂ්ඨ තක්සේරුකරුවන් දෙදෙනෙකු (2)තක්සේරුකරුවන් අට (8) දෙනෙකු, බදු නිලධාරීන් අට(8) දෙනෙකු සංවර්ධන සහකාර නිලධාරීන් දෙදෙනෙකු (2) ද එම අංශය වෙත අනුයුක්ත කරන ලදි. ඒ අනුව ඉලක්ක කල මුද්දර ආදායම ඉක්මවා යෑමට දෙපාර්තමේන්තුවට හැකි විය. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව 21% වර්ධනයක් කරා ලගා වීමට දෙපාර්තමේන්තුවට හැකි විය.


2011 වසරේ ආදායම තුල අතිරේක මුද්දර ගාස්තු ලෙස අයකල රු 16,680,730/- ක් ඇතුලත් වන අතර 2012 වසරේ රැස් කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම රු: 53,011,739/- කි. එය පෙර වර්ෂයට සාපේක්ෂව 218% ක වර්ධනයකි. එයට හේතු වූයේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පුළුල් දැක්මක් අනුව කටයුතු කිරීම බව කිවයුතුය.. එමෙන්ම මාණ්ඩලික නිලධාරීන්ට ආදායම් ඉලක්ක ලබා දුන් අතර ඔවුන්ගේ එම ආදායම් ඉලක්ක වෙත ලගා වීමේ ප්‍රගතිය මාසික වාර්තාවක් සේ ප්‍රධාන ලේකම්තුමා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදි.

**මුද්දර ගාස්තු ආදායම**

| වර්ෂය | ඉලක්කය | ආදායම රු. | වර්ධනය % |
|---|---|---|---|
| 2007 | 420,000,000 | 425,379,136 | |
| 2008 | 659,000,000 | 417,795,728 | -2 |
| 2009 | 907,000,000 | 374,752,586 | -10 |
| 2010 | 440,000,000 | 481,400,739 | 28 |
| 2011 | 368,000,000 | 684,335,872 | 42 |
| **2012** | **725,000,000** | **827,681,905** | 21 |

**අතිරේක මුද්දර ගාස්තු ආදායම**

| වර්ෂය | ආදායම රු. |
|---|---|
| 2008 | 1,884,361 |
| 2009 | 2,592,691 |
| 2010 | 838,308 |
| 2011 | 16,527,044 |
| 2012 | 53,011,739 |



**2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 60ක් 2012 දී එකතු කිරීම**

පිරිවැටුම් බද්ද අහෝසි වීමත් සමග 2011 වර්ෂයට පෙර වර්ෂයන් සඳහා ගෙවිය යුතු හිගව පවතින බදු ගෙවීමට බදු ගෙවන්නන්ගේ අනුකූලතාව ඉතා අඩු වූ අතර, එම බදු අයකර ගැනීමට ප්‍රඥප්තිය ප්‍රකාරව ගතහැකිව තිබූ සියළු ක්‍රියාමාර්ග ගන්නා ලදි. ඒ අනුව 2012 වර්පයේදී රු 45,761,784/- ක මුදලක් එකතු කරන ලද අතර ඒ වෙනුවෙන් ගොනු කරන ලද නව නිතිමය පියවර ගැනිම 77 ක්ද, ස්ථානයට ගොස් කරන ලද දැනුවත් කිරීම් 410ක්ද, විය. එමෙන්ම සියළුම හිග බදු අධ්‍යයන කොට දත්ත සමුදායක් ගොඩනැගු අතර, එහිදී වර්තමානය වන විට පැවති ව්‍යාපාර බුන්වත් වූ, හිමිකරුවන් මියගිය බදු ප්‍රමාණයක් ලෙස රු 20,982,768/- ක මුදලක් හදුනාගෙන ඇත.

**2012 ව¾ෂයේ දී මධ්‍යම පළාත් ආදායම් දෙපා¾තමේන්තුවේ සමස්ථ ආදායම් රැස් කිරීම පහත පරිදි වේ.**

| ආදායම් ප්‍රභවය | ඉලක්කය රුපියල් | සත්‍ය ආදායම රු. | ළඟාවීමේ ප්‍රගතිය % |
|---|---|---|---|
| මුද්දර ගාස්තු | 725,000,000 | 827,681,905 | 114 % |
| හිග පිරිවැටුම් බදු | 60,000,000 | 45,761,784 | 76 % |
| ඔට්ටු බද්ද | 300,000 | 483,039 | 161 % |
| එකතුව | **785,300,000** | **873,926,728** | **111 %** |

ඉහත සඳහන් සියළු අරමුණු ළඟා කර ගැනීම සඳහා පහත පරිදි ක්‍රියාකාරි සැලැස්මක් 2012 වර්පයේදී පළාත් ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාවට නංවන ලදී.

| **අරමුණ** | අංශය | කාර්යයන් | ඉලක්කය | ඉලක්ක ළඟා කර ගැනීම |
|---|---|---|---|---|
| . 2012 වර්පයේදී මුද්දර ගාස්තු ආදායම ලෙස රුපියල මිලියන 725 ක්එකතු කිරීම. | මුද්දර අංශය | 1. ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් සෘජුව ලැබෙන තොරතුරු අංශ අනුව බෙදාහැරීම<br>2. අදාල කාර්යාල වලට ගොස් තොරතුරු රැස්කිරීම | 20000 | 27876 |
| | | 3. මෙම ලබාගත් තොරතුරු අදාල අංශ අනුව බෙදා හැරීම | | සම්පූර්ණ කර ඇත |
| | | 4. තොරතුරු ලේකනයට අනුව ගොනු ආරම්භ කිරීම | 9000 | 9051 |
| | | 5. ගොනු සඳහා සාධන පත්‍ර කැඳවීම. | 9000 | 9051 |
| | | 6. ගොනු විශ්ලේෂණය කිරීම. | 9000 | 9051 |
| | | 7. සාධන පත්‍ර නොලැබුණු ගොනු හඳුනා ගැනීම. | | |
| | | 8. i.. ගෙවූ ගාස්තු ප්‍රමාණවත් නම් ගොනුව අවලංගු කිරීම. | | |

| | | | | |
|---|---|---|---|---|
| | | ii. ගෙවීම් ප්‍රමාණාත්මක නොවන්නේ නම් සම්මුඛ සාකච්ඡා කැඳවා අතිරේක මුද්දර ගාස්තු තීරණය කිරීම හෝ එකතු නොවනවිට ස්ථාන පරීක්ෂණ සිදුකර හෝ අතිරේක මුද්දරගාස්තු තීරණය කිරීම<br><br>9. තක්සේරු දැන්වීම නිකුත් කිරීම.<br><br>10. අභියාචනා /විරෝධතා විසඳීම.<br><br>11. තක්සේරු දැන්වීම මත ගෙවා නොමැති නම් නීතිමය පියවර ගැනීම | රු.මි. 42 | රු.මි. 53<br><br>681<br><br>කටයුතු ආරම්භ කොට ඇත. |
| 2. පවතින හිඟ පිරිවැටුම් බදු වලින් රුපියල් මිලියන 60 ක් 2012 දී එකතු කිරීම. | තක්සේරු අංශය<br><br>පිරිවැටුම් බදු | 1. පිරිවැටුම් බදු වාර්තා සපයා බදු ගෙවා නොමැති හෝ වාර්තා සපයා නොමැති කාර්තු සඳහා තක්සේරු දැන්වීම් හෝ අතිරේක තක්සේරු නිකුත් කිරීම. | 600 | 232 |
| | | 2. පිරිවැටුම් බදු වාර්තා පරීක්ෂා කර ස්ව.තක්/නිදහස් ලකුණු කිරීම. | 10000 | 30104 |
| | | 3. ලිපිගොනු ආවේක්ෂණය කිරීම. | 3000 | 6148 |
| | | 4. ලිපිගොනු විගණනය කිරීම. | 200 | 210 |
| | | 5. අක්‍රිය ලිපිගොනුවල කටයුතු නිම කිරීම - ගොනු සංඛ්‍යාව අඩු කිරීම. | 1000 | 1044 |
| | | 6. 2010-12-31 දක්වා පිරිවැටුම බදු ලිපිගොනුවල කටයුතු නිම කර ගොනු අවසන් කිරීම. | 2000 | 1723 |
| | අය හා හිඟ බදු අංශය | 1. හිඟ පිරිවැටුම් බද්ද පිළිබඳ පරිගණක දත්ත සමුදායක් ගොඩ නැගීම. | | සම්පූර්ණ කර ඇත |
| | | 2. 2011.12.31 දින පවතින අයකර ගත හැකි හිඟ පිරිවැටුම් බදු ලෙස හඳුනා ගැනීම<br><br>3. අභියාචනා /විරෝධතා විසඳීම.<br><br>2011-12-31 දක්වා ඉදිරිපත් කර ඇති අභියාචනා විසඳා අවසන් කිරීම. | සියල්ලම | සම්පූර්ණ කර ඇත |
| | | 4. පැහැර හැරි තැනැත්තන්ගේ ස්ථානවලට ගොස් හිඟ බදු එකතු කිරීම.(D 7) | 250 | 410 |
| | | 5. නොගෙවූ හා එකගතාවයකට නොපැමිණෙන අය වෙනුවෙන් නීතිමය පියවර ගැනීම. | 75 | 77 |
| | | 6. ගෙවීම්පත්වල දත්ත පරිඝනකගත කිරීම.<br><br>7. අගරු චෙක්පත් පිළිබඳව ප්‍රමාදයකින් තොරව කටයුතු කිරීම. | සියල්ලම | සම්පූර්ණ කර ඇත |

| | | | | |
|---|---|---|---|---|
| 3. සියයට දහයට (10 % ) වැඩි වාර්ෂික ආදායම් වර්ධන අනුපාතයක් පවත්වාගෙන යාම. | නව ආදායම් උත්පාදන ක්‍රම සොයා ගැනිම හා අනුමත කර ගැනිම. | 1. නිති අධ්‍යයනය කිරිම හා පවතින ප්‍රභවයන් මොනවාදැයි අධ්‍යයනය කිරිම.<br>2. එම ප්‍රභවයන් පිළිබඳ සබ්‍යතා අධ්‍යයනයක් සිදු කිරිම.<br>3. එම එක් එක් ආදායම් ප්‍රභවයන්ගෙන් උපයාගත හැකි ආදායම හඳුනාගැනිම<br>4. ක්‍රියාත්මක කිරිමට වඩා සුදුසු ආදායම් ප්‍රභවයන් තීරණය කිරිම<br>5. හඳුනාගත් නව ආදායම් උත්පාදන ක්‍රම යෝජනාවලිය ප්‍රධාන ලේකම්ටඉදිරිපත් කිරිම | | oekgu;a Lksc noao, T!IO yd ridhk.dr noao yd W.ia nvq .kakka iïnkaO m%{ma;s, uOHu m<d;a m%{ma;s lñgqjg bosrsm;a lr we;. |
| | කාර්යය මණ්ඩල පුහුණුව හා සංවර්ධනය | 1. වෘත්තිය පුහුණු අවශ්‍යතා ක්ෂේත්‍රයන් හඳුනාගැනිම<br>2. පාඨමාලා ක්‍රමවේදයක් සකස් කිරිම.<br>3. සම්පත්දායක පුද්ගලයන් සහ ආයතන හඳුනාගැනිම.<br>4. පිරිවැය හඳුනාගැනිම. | | සම්පූර්ණ කර ඇත |
| | නෙවන පාර්ශ්වයන් දැනුවත් කිරිම | 1. අදාල ස්ථානවල ප්‍රදර්ශනය සඳහා දැන්වීමක් සකස් කිරිම හා ප්‍රදර්ශනය කරවීමට සැලැස්වීම<br>2. පුවත්පත් දැන්වීම් එල කිරිම<br>3. දැනුවත් කිරිමේ වැඩමුළු පැවැත්වීම<br>4. වෙබ් පිටුවක් සැකසීම | | සම්පූර්ණ කර ඇත<br><br>ප්‍රතිපාදන නොමැති විය |

ඉහත සියලුම දත්තයන් ලබා ගන්නා ලද්දේ නිලධාරින්ගේ දෛනික, මාසික, අර්ධ වාර්ෂික, වාර්ෂික ප්‍රගති වාර්තා සියල්ල පරීක්ෂා කිරිමෙනි.

මීට අමතරව අපගේ ප්‍රගතිය වර්ධනය කර ගැනිම සඳහා මහජනතාව,ව්‍යාපාරික ප්‍රජාව, ඉඩම් රේජිස්ටාර් කාර්යාල, ප්‍රාදේශිය ලේකම් කාර්යාල, රජයේ තක්සේරුදෙපාර්තමේන්තුව, මහජන බැංකුව, ලංකා බැංකුව හා පොලිසිය, අධිකරණ සහ වෙනත් රජයේ ආයතන මෙන්ම ගරු ආණ්ඩුකාරතුමා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා සහ ප්‍රධාන ලේකම්තුමා ඇතුදු කාර්ය මණ්ඩලයෙන් ලැබුණු සහයෝගයද කෘතඥතා පූර්වකව සඳහන් කර සිටිමු.

2013 වර්ෂයේ දී ද අපගේ 2013 ක්‍රියාකාරි සැලැස්ම තුලින් ඉදිරිපත් කරනු ලබන ඉලක්ක අභිබවා යමින් මධ්‍යම පලාත් සභාවේ ආදායම් වර්ධනයට ඉහළම දායකත්වයක් ලබා දීමට අපි ඇප කැප වෙමු.

**ස්තුතියි!**

(එච්.කේ. අජන්තා පෙරේරා)

පලාත් ආදායම් කොමසාරිස්

මධ්‍යම පලාත